# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,153 — 1960 ජූලි 1 වැනි සිකුරාදා — 1.7.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 455 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 458 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... | 461 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 477 | විවිධ දැන්වීම් ... ... ... | — |


### තනතුරු—ඇබෑර්තු

#### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායයී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට බැර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීහු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එලඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එක තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(9) ඉගෙනීම ලැබූ පාඨශාලා (දිනයන් සමග) :————.

(10) සිංහල දැනුම පිළිබඳ විශේෂ සුදුසුකම් ඇතොත් ඒ බව : ————.

(11) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි ලඝු ලේඛනය පිළිබඳ දැනුමක් තිබේ ද ? :————.

(12) ඉංග්‍රීසි පිළිබඳ දැනුමක් ඇතොත් ඒ කොපමණ ද යන වග :————.

(13) දැන් රක්ෂාවක යෙදී සිටි නම් ඒ බව :————.

(14) පියාගේ හෝ භාරකාරයාගේ හෝ නම හා ඔහුට/ඇයට ලියුම් ලැබෙන පිළිවෙල :————.

(15) තමා ගැන තොරතුරු විමසිය යුත්තන් දෙදෙනෙකුගේ නම් හා ලියුම් ලැබෙන පිළිවෙල :————.

(16) අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සුදුසුකම් හා චරිතය පිළිබඳ සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන් ද මේ සහතික පත්වල පිටපත් ද (මුල් සහතික නොවේ) ඇමිණිය යුතු යි. එක් සහතිකයක් තමා අන්තිමට ඉගෙන ගත් පාසැලේ මුල් ගුරු තුමාගෙන් විය යුතු යි :————.

(17) වෙනත් සුදුසුකම් :————.

(18) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් සම්මාන සාමාර්ථ්‍යය ලැබූ විෂයයන් :————.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

### පුහුණු වූ සිංහල ගුරු තනතුරු

පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පුහුණු වූ සිංහල ගුරු තනතුරු සඳහා ගුරු මහතුන්ට ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ.

**2. අයදුම් පත්—**

(අ) මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව තම අත් අකුරින්ම පුරවා,

(ආ) පරිවාස සහ ළමාරක්ෂක සේවා කොමසාරිස් තැන, නො. 3, බගතලේ පාර, කොළඹ 3, යන ලිපිනයට (පෞද්ගලික නමට නොව)

(ඉ) 1960 ජූලි මස 15 වෙනි දින හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන ලෙස ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

**සැලකිය යුතුයි.**—අයදුම්පත් එවන කවරයේ වම් පැත්තේ මුදුනේ "සිංහල පුහුණු ගුරු තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය" යන්න ලිවිය යුතුයි.

3. **වැටුප් ක්‍රමය.**—වාර්ෂික වැටුප් රුපියල් 1,608—72×15—2,688.

**4. සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි—**

(1) තෝරා ගන්නා අයදුම් කරුවන් විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරු දරන්නන් ලෙස ගනන් ගන්නා අතර, ඔවුන් විසින් වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් පනත යටතේ දායක මුදල් ගෙවිය යුතුයි.

(2) තෝරා ගන්නා අයදුම් කරුවන් අවුරුදු තුනක ප්‍රවාසනයට යටත් වේ. මේ කාල සීමාවේදී ඔවුන්ගේ වැඩ අසතුටුදායක නම් ඕනෑම වේලාවක හෝ මේ කාල සීමාව අගදී ඔවුන් සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ.

(3) තෝරා ගන්නා අයදුම්කරුවන් ලංකාවේ ඕනෑම තැනක සේවය කළ යුතු අතර, අනුමත කළ පාඨශාලාවල ඇති අමතර අධ්‍යාපනික වැඩ වලටද ඔවුන්ගේ සහයෝගය දීමට සිදුවේ.

5. **අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සඳහා සැලකිය යුතු සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—**

(1) ලාංකිකයෙක් බව,

(2) දැනට රජයේ සේවයෙහි නියුක්ත නැති නම් 1960 ජූලි 15 වෙනි දිනට අවුරුදු 24 ට නොඅඩුත් 40 ට නොවැඩිත් බව,

(3) සිංහල අභ්‍යාස විද්‍යාලීය පුහුණු වූ සහතික පත්‍ර විභාගයෙන් සමර්ථ වූ බව,

(4) අඩු වශයෙන් 3 වසක ඉගැන්වීමේ පලපුරුද්දක් ඇති බව.

**සැලකිය යුතුයි.**—සමාජ සේවා වැඩ පිළිබඳ සහතිකපත් හෝ පලපුරුදුකම් ඇති අයදුම් කරුවන් සඳහා විශේෂ සැලකීමක් දක්වනු ලැබේ.

6. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් සහතික වල පිටපත් පමණක් ඇමිණිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති සිංහල පුහුණු ගුරු සහතිකය, සහ

(ඉ) චරිතය පිළිබඳ මෑතදී ගත් සහතික තුනක්.

7. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර බාර ගනු නොලැබේ. පස්වැනි ජෙදයෙහි සඳහන් සුදුසුකම් ලත් දැනට රාජ්‍ය සේවාවෙහි සිටි අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුයි. එවැනි ඉල්ලුම්පත්‍ර නියමිත දිනට පසුව මෙම දෙපාර්තමේන්තුවට ලැබුනොත් ඒ ඉල්ලුම්පත්‍ර ඒ ඒ අයදුම්කරුවන්ගේ ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත ඒ දිනයට කලින් ලැබුණු බව සඳහන් කර එම ඉල්ලුම්පත්‍ර ප්‍රමාදවීමට සැහෙන හේතු දක්වමින් ඒ ඒ ප්‍රධානීන් එම ඉල්ලුම්පත්‍ර භාර ගන්නා ලෙස නිර්දේශයක් කළහොත් පමණක් එසේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ.

8. ගැසට් පත්‍රයේ පළවෙනි කොටසේ දෙවෙනි ජෙදයේ මුළු පළවෙන රාජ්‍ය සේවායේ තනතුරුවලට පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි බලනු මැනවි.

9. මේ නිවේදනයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරන අතරම අයදුම්පත් භාරගත් බවට පිළිතුරු සපයනු නොලැබේ.

එම්. සිවනාදන්,
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් තැන.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,
නො. 3, බගතලේ පාර, කොළඹ 3,
1960 ජූලි 1 වැනි දා,

### ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (අච්චු අකුරෙන්) :————.
   පෙලපත් නම :————.
   අනිකුත් නම් :————.
2. ස්ථිර ලිපිනය :————.
3. වයස හා උපන් දිනය :————.
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහකද යන වග :————.
6. අධ්‍යාපන හා අනිකුත් සුදුසුකම් හා නිවේදනයේ සඳහන් පරිදි පලපුරුදු කම් :————.
7. පාසැල් ජීවිතය පිළිබඳ විස්තර සහ පාඨශාලීය විශේෂ කටයුතු පිළිබඳ වාර්තා :————.
8. පාඨශාලාවෙන් අස්වීමෙන් පසු කරන ලද රැකියා සහ රජය යටතේ සේවය කළා නම් :

   එහි විස්තර :————.
   (පළමු සේවායන්ගෙන් ගත් සහතික ඇමිණිය යුතුයි)
9. දැනට කරන රැකියාව :————.
10. චරිත සහතික ලබා ගත් පුද්ගලයින්ගේ නම් සහ පදවි නාමයන් :————.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## පුහුණුවූ වින්නඹු මාතාවකගේ තනතුරක්

### ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව

1. ස්වදේශීය ආරෝග්‍යශාලාවේ (පුහුණුවූ) වින්නඹු කෙනකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දී ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පුරවන ලද ඉල්ලුම් පත්‍ර 1960 ජූලි 25 දාට හෝ ඉන් ප්‍රථම ලැබෙන සේ කොළඹ 8, ස්වදේශ වෛද්‍ය සංවර්ධන කොමසාරිස් තුමාට එවිය යුතු ය.

2. **වාර්ෂික පඩි ක්‍රමය.**—රුපියල් 696—18—1,038.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. 1957.4.29 දිනැති අංක 372 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛණය අනුව මෙම තනතුර දරන්නාගේ අභිමතය පරිදි විශ්‍රාම වැටුප් සේවයට ඇතුල්වීමට පුළුවන. තෝරාගත් අය අවුරුදු 3ක ආධුනික කාල සීමාවකට යටත් ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම් කරුවකු විසින් ම පහත සඳහන් කරුණු සත්‍යය බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය:—

(අ) ලංකාණ්ඩුවේ වෛද්‍ය මණ්ඩලය විසින් පිරිනමන ලද වින්නඹු කෙනකු හැටියට ලියා පදිංචිවීමේ සහතික දරන්නකු බවට.

(ආ) යහපත් චරිත ගුණියකින් හා ශරීර සෞඛ්‍යයකින් යුක්ත බවට.

(ඉ) 1960.7.25 දිනට වයස 18ට නොඅඩු හා 35ට නො වැඩි බවට.

5. ඉල්ලුම් කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතිකපත්වල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු. බෞතීස්ම සහතිකය සහ උපකෘත පාඨශාලාවල නීතිරීති සංග්‍රහයන් සඳහා වූ සහතික ද පිළිගනු නො ලැබේ.)

(ආ) තමන් විසින් ලබාගෙන ඇති උසස් ම අධ්‍යාපනීය හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) ඉල්ලුම්කරුගේ චරිත ශුද්ධිය පිළිබඳ ළඟ දී ලබාගත් සහතික දෙකක්.

**සැළකිය යුතුයි :**—ලියකියවිලිවල පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. මෙම ගැසට් පත්‍රයෙහි පළමු වැනි කොටසේ 2 වැනි ඡෙදයේ ආරම්භයේදී පළකොට ඇති රාජ්‍යසේවා තනතුරුවලට අවධානය යොමු කරනු කැමැත්තෙමි.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
ස්වදේශීය වෛද්‍යක්‍රම සංවර්ධන කොමසාරිස්.

1960 ජූනි මස 20 වැනිදා,
කොළඹ 8, ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේදීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ වින්නඹු මාතාවකගේ තනතුරට ඉල්ලුම් කිරීම**

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරින්)

2. ලිපිනය :————.

3. ජාතිය :————.

4. උපන් දිනය හා ස්ථානය (අයදුම්කරුගේ) :————.

5. උපන් දිනය හා ස්ථානය (අයදුම්කරුගේ පියාගේ) :————.

6. විවාහකද ? අවිවාහකද ? :————.

7. අධ්‍යාපනික සුදුසුකම් :————.

8. වින්නඹුවක් වශයෙන් ලියාපදිංචිවූ අංකය :————.
(ඉල්ලුම් පත්‍රයේ සහතික පත්‍රයේ පිටපත ඇමිණිය යුතුයි)

9. පාසලෙන් අස්වූ දින සිට කරන ලද සේවයන් පිළිබඳ විස්තර දිනයන් ඇතුළුව :————.

10. සිංහල හා දෙමළ භාෂාවෙන් කියවීම, ලිවීම හා කථාකිරීම පිළිබඳ දැනුම :————.

11. වෙනත් විශේෂ සුදුසුකම් ඇතොත් ඒවායේ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### මිනින්දෝරු දෙපාර්තමේන්තුව—මිනින්දෝරු අභ්‍යාස විද්‍යාලය

**පරීක්ෂණ දිනය**

ඉහත සඳහන් විද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුලත් කර ගැනීම සඳහා තරඟ පරීක්ෂණයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන් 1960 සැප්තැම්බර් මස 9 සහ 10 වැනි දිනවල කොළඹ, මහනුවර ගාල්ල, යාපනය, කුරුණෑගල සහ මඩකලපුව යන මධ්‍යස්ථානයන්හිදී පවත්වනු ලැබේ.

**සැලකිය යුතුයි.**—සෑහෙන තරම් අපේක්ෂක සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන මධ්‍යස්ථානයක් වෙතොත් එහි පරීක්ෂණය පවත්වනු නොලැබේ.

**සුදුසුකම්**

2. (අ) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුය. පරීක්ෂණය ආරම්භ වන දිනට ඔවුන්ගේ වයස අවුරුදු 19ට නො අඩු වත් අවුරුදු 25ට නො වැඩි වත් තිබිය යුතු ය. " ලාංකිකයෙක් " යනුවෙන් අදහස් කරනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රට වැසියෙකු වූවෙකි.

(ආ) ඉල්ලුම් කරුවන්ට යටත් පිරිසෙයින් (බීජ ගණිතය හා ජ්‍යාමිතිය අඩංගු (Mathematics) ගණිත විෂයයෙන් ලද සාමාර්ථයක් ද සහිතව ලංකාවේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පරීක්ෂණයෙන් නැතහොත්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ (බීජගණිතය හා ජ්‍යාමිතිය අඩංගු (Mathematics) ගණිතය, සිංහල/දෙමළ භාෂාව සහ වෙනත් විෂයයන් හතරකින් දෙවාරයකට නො වැඩිව සමාර්ථය ලත් බවට සහතික තිබිය යුතුයි.

3. පහත සඳහන් ලියවිලි (පිටපත් නොවේ) අයදුම් පත්වලට අමුණා එවිය යුතු ය:—

(අ) ඉල්ලුම්කරුගේ යහපත් චරිතය පිළිබඳව වග කිව යුතු පුද්ගලයකු විසින් අත්සන් තබන ලද චරිත සහතිකයක්.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා අධ්‍යාපනය ලැබුවේ ආණ්ඩුවේ පාඨශාලාවක හෝ ආධාර ලබන පාඨශාලාවක හෝ නම්, චරිත සහතිකය ලබා ගත යුත්තේ තමා අන්තිමට උගත් ආණ්ඩුවේ පාඨශාලාවේ හෝ ආධාර ලබන පාඨශාලාවේ හෝ ප්‍රධානාචාර්යවරයාගෙනි. නොඑසේ වන කල්හි එම සහතිකය සමාදාන විනිශ්චයකාරයෙක්, අද්වකාත් කෙනෙක්, පෙරකදෝරු කෙනෙක් හෝ නොතාරිස් කෙනෙක්, ප්‍රාදේශීය ආදායම් නිලධාරියෙක් හෝ රුපියල් 2,400ක් හෝ ඉන් වැඩි වාර්ෂික වැටුපක් හෝ ලබන ආණ්ඩුවේ ස්ථිර නිලධාරියෙක් හෝ, සාමාන්‍යයෙන් කෙළින් ම තොරතුරු ලබාගත හැකි ප්‍රකට තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන් වුව ද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ නම, පදවි නාමය සහ ලිපිනයද සහතිකයේ පැහැදිලිව සඳහන් විය යුතු ය.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කරන ලද පිටපතක්.

**සංලක්ෂ්‍යය.**—(i) පාඨශාලීය හෝ අධ්‍යාපනික හෝ කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගත් සහතික කළ ලුහුඬු පිටපතක් හෝ භාරගනු නො ලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට දිවුරුම් පත්‍ර හෝ බව්තීස්ම සහතික හෝ භාරගනු නො ලැබේ.

(iii) උප්පැන්න සහතිකයෙහි දක්වෙන, නම/නම් හා ඉල්ලුම්කරු සාමාන්‍යයෙන් භාවිත කරන, එසේ ම ඔහු පරීක්ෂණයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම්, යථායෝග්‍ය පරිදි, 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතෙහි අංක 27 නැතහොත් 28 දරණ වගන්ති නියමයන් අනුව උප්පැන්නයෙහි දක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතු ය. උපන් දින සිට අවුරුද්දකට වඩා කල් ගත වීමෙන් පසු 1953 අංක 15 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 2 වැනි වගන්තියෙන් සංශෝධිත වූ 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතෙහි 24 (6) දරණ වගන්තිය යටතේ කරවන ලද උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනක සහතික කරන ලද පිටපතක්, පත්වීම් දීම පිළිබඳ වූ කරුණු උදෙසා පිළිගනු ලබන්නේ, උපන් දිනය තහවුරු කෙරෙන සාක්ෂි ගැන සලකා බැලීමෙන් පසුව පමණි.

(ඇ) ලංකාවේ රටවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ රටවැසි බවක් ඇති සේ ආණ්ඩුව මගින් පිළිගත් බැව් දක්වෙන ලිපියේ මුල් පිටපත (අවස්ථෝචිත වන පරිදි).

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම්, ඊට අදාළ වූ අන් කිසි රාජකාරිය ලියවිල්ලක් (උදාහරණයක් වශයෙන්, පෞද්ගලික අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද ලංකා අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය) විභාගයේ ප්‍රතිඵල පත්‍රිකාව හෝ අපේක්ෂකයාගේ පාඨශාලාවේ ප්‍රධානියාගෙන් ලබා ගත් ලිපියක්).

**විශේෂ අනුග්‍රහ**

4. **ස්ථිර සේවකයෝ.**—(අ) 1960 ජූනි මස 24 වැනි දින මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවයෙහි නියුක්ත අයට, පහත සඳහන් අවශ්‍යතා තිබේ නම් පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ:—

(i) 2 (ආ) ඡේදයේ නියමිත අධ්‍යාපන සුදුසුකම් තිබේ නම්;

පරීක්ෂණයට පෙරාතුව හෝ එය පවතිද්දී හෝ ඉන් පසුව හෝ කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ අපෙක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

(ii) අපේක්ෂකයකු විසින් දූන දූන ම අසත්‍ය තොරතුරු සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දූන දූනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත්, එසේ නැතහොත් ඔහු මෙම පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සෙකුව සිටි බැව්, ඔහුගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත් හෝ එය ම ඔහු අප්‍රමාදව සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත.

(iii) පරීක්ෂණයට ඇතුළත් කර ගනු ලැබීම ම අපෙක්ෂකයකුගේ යෝග්‍යතාව පිළිගැනීමක් නො වන්නේ ය.

11. අපෙක්ෂකයන් මනා කාය ශක්තියෙන් හා ඇස් පෙනීමෙන් ද යුක්ත විය යුතු ය.

**ආපසු ගෙවීම්**

12. කිසිම කරුණක් නිසා හෝ පරීක්ෂණ ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

| **පරීක්ෂණයට නියමිත විෂය මාලාව** | **ලකුණු** |
|---|---|
| 13. (i) භාෂාව හා රචනය—වාක්‍ය රචනයක්, සාරංශ ලිවීමක් සහ නිවැරදි භාෂා ව්‍යවහාරය පරීක්ෂා කිරීම පිළිබඳ ප්‍රශ්න ද ඇතුළත් පැය එක හමාරක පත්‍රයකි | 150 |
| (ii) (ත්‍රිකෝණමිතිය නොමැතිව) එකතු කිරීම් ඇතුළත් ගණිත පරීක්ෂණය, පැ. එකයි ... ... | 100 |
| (iii) ලඝුගණක සහ ත්‍රිකෝණමිතිය පිළිබඳ සරල ප්‍රශ්න ද ඇතුළත් පරීක්ෂණය, පැ. එකයි ... ... | 100 |
| (iv) සාමාන්‍ය බුද්ධි පරීක්ෂණයක්, මිනිත්තු 40 ... | 50 |
| (v) ඇඳීම, පැය තුනහමාරක පත්‍රයකි ... ... | 150 |

ආකෘති සිතියමක් විශාල කර තීන්තෙන් ඇඳ පාට කිරීමට සහ අක්ෂර යෙදීමට ද අපෙක්ෂකයන්ට නියම කරනු ඇත, සිතියම ඇඳිය යුත්තේ නිදහස් අතිනි. (අපෙක්ෂකයන් පරීක්ෂණයට එන විට ඉන්දියන් තීන්ත, දිය සායම් සහ ඇඳීමේ උපකරණ ද රැගෙන පැමිණිය යුතුය.)

මේ සිතියමේ ආදර්ශ සටහනක් කොළඹ කොටුවේ පහළ, චැතැම් වීදියේ සර්වේ ජනරාල් කාර්යාලයේ දී ද, ගාල්ල, කුරුණෑගල, බදුල්ල, අනුරාධපුරය, මහනුවර, ත්‍රිකුණාමලය, දියතලාව සහ කිලිනොච්චි යන නගරවල ඇති ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවලදී ද අපේක්ෂකයන්ට බලා ගත හැකිය.

**සංලක්ෂ්‍යය.**—(i) සිට (v) දක්වා වූ විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍ර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් සැපයෙනු ඇත. මෙහි 2 (ආ) වැනි ඡේදයේ හෝ 4 (ආ) (1) ඡේදයේ අදාළ වූ පරිදි නියමිත සුදුසුකම් ලැබීමේ විභාගයෙන් අපෙක්ෂකයන් සමත් වූයේ යම් මාධ්‍යයකින් ද එම මාධ්‍යයෙන්ම ඔවුන් මේ විෂයයන් ද ගත යුතුයි, එහෙත්—

(අ) අපෙක්ෂකයෙක් සුදුසුකම් ලැබීමේ විභාගයේ නොයෙක් විෂයයන් වෙන වෙන මාධ්‍යවලින් සමර්ථ වූයේ නම්, මෙම පරීක්ෂණයට අඩංගු වන එම විෂයයන් ඒ ඒ මාධ්‍යවලින් ගත යුතුයි. මෙම පරීක්ෂණයේ අනිකුත් විෂයයන් "භාෂාව හා රචනය" ගන්නා වූ මාධ්‍යයෙන් ගත යුතුයි.

(ආ) සුදුසුකම් ලැබීමේ විභාගය ඉංග්‍රීසි හෝ දෙමළ මාධ්‍යයෙන් ගෙන සමත් වූ අයට තමන් කැමති නම් මේ විෂයයන් සිංහල මාධ්‍යයෙන් ගත හැකිය.

| | |
|---|---|
| (vi) විශෙෂ පත්‍රය (ඉංග්‍රීසි) මෙය (1) වැනි විෂය එනම් භාෂාව හා රචනය) සිංහලෙන් හෝ දෙමළෙන් ගත් අය සඳහා වූ එක් පැයක පත්‍රයකි ... ... | 100 |

**සංලක්ෂ්‍යය.**—භාෂාව පිළිබඳ මේ විශේෂ ප්‍රශ්න පත්‍රය අධ්‍යයන පොදු සහතික විභාගයේ තත්ත්වයෙන් දෙනු ලබන්නකි. තෝරා ගනු ලැබීමට මේ පත්‍රයෙන් අවු ගණනේ සියයට 30ක් වත් ලකුණු ගත යුතුය. මේ පත්‍රයෙන් ගනු ලබන ලකුණු තරඟය සඳහා ගණනට ගනු නොලැබේ.

**තේරීම් මණ්ඩලය**

14. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව, අපෙක්ෂකයන්ගෙන් එක්තරා සංඛ්‍යාවක් තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට පෙනී සිටීමට කොළඹට කැඳවනු ලැබේ. තේරීම් මණ්ඩලය ඉදිරිපිටට කැඳවනු ලබන අපෙක්ෂකයින්ගේ සංඛ්‍යාව නියම කරනු ලබන්නේ සර්වේ ජනරාල් විසිනි.

15. මණ්ඩලය විසින් තෝරා ගත් අපෙක්ෂකයින් මිනින්දෝරු වැඩ භාර ගැනීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත බවට නිශ්චය කිරීම සඳහා ඔව්හු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් වෛද්‍ය පරීක්ෂණයකට භාජන කරනු ලැබෙති. මේ පරීක්ෂණය සඳහා අපෙක්ෂකයකුගෙන් රුපියල් 5ක් අය කරනු ලැබේ.

**අභ්‍යාස විද්‍යාලයට ඇතුළත් කර ගැනීමේ කොන්දේසි**

16. (i) සෑම අපෙක්ෂකයෙකු ම, තමා පුහුණුව සඳහා තෝරා ගැනීමෙන් පසු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව සමාප්ත කොට, දෙවැනි ශ්‍රෙණියේ මිනින්දෝරුවකු වශයෙන් අවුරුදු තුනක් සේවය කිරීමට ද, පුහුණුවන කාලයේදී තමාගේ නොසැලකිල්ල නැතහොත් නොපරිස්සම්කම නිසා නැති වන හෝ හානි සිදුවන භාණ්ඩ හෝ උපකරණ සඳහා රජයට අය විය යුතු අලාභ ගෙවීමටද, බැඳෙමින් රු. 6,000ක් වත්කම ඇති පිළිගත් ඇපකරුවකු ඇති ව ගිවිසුමකට හා බැඳුම්කරයකට ද ඇතුළත් විය යුතු ය.

වත්කම ඇති ඇපකරුවන් ඉදිරිපත් කිරීමට නොහැකි අයට, පුහුණුව ලබන කාලයේදී මසකට රු. 40 බැගින් ද, ඊට පසු අවුරුදු තුනක් ගෙවෙන තෙක් මසකට රු. 80 බැගින් ද රජයට ඇප මුදල් බැඳීමට පෞද්ගලික බැඳුම්කරයකට ඇතුළත් වීමට ඉඩ දෙනු ලැබේ. මේ මුදල ඔවුන්ගේ පඩි සටහන්වලින් අඩු කරගෙන එය ඔවුන් විසින් කොන්දේසි ආදිය පැහැර නො හැරීමට ඇප වශයෙන් තබා ගනු ලැබේ. ගිවිසුමේ හා බැඳුම්කරයේ ඇතුළත් කරුණු හා කොන්දේසි යථා පරිදි ඉටු කළ කල්හි මේ මුදල් ඔවුන්ට ආපසු දෙනු ලැබේ.

(ii) මේ ගිවිසුම හා බැඳුම්කරය අපේක්ෂකයා අභ්‍යාස විද්‍යාලයට පත්වූ දින පටන් බල පැවැත්වේ.

(iii) මිනින්දෝරු ශිෂ්‍යයන් වශයෙන් තෝරාගනු ලබන අපෙක්ෂකයන් අංක 428 හා 58.1.31 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (බී) (v) ඡේදයේ නිරූපණය කළ පරිදි නව ප්‍රවේශක සංඛ්‍යාවට ඇතුළත් නම්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා තිබෙන්නා වූ හෝ මින්මතු පනවනු ලබන්නා වූ හෝ ව්‍යවස්ථාවන්ට අනුකූලව, ඔව්හු ක්‍රියා කළ යුත්තාහ. විශේෂයෙන් ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ නියමයන් ක්‍රියාත්මක කිරීමට අදාළ වන අන්දමින් ඔව්හු ක්‍රියා කළ යුත්තාහ. 13 වැනි ඡේදයේ සඳහන් භාෂාව හා රචනය ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසියෙන් හෝ දෙමළ මාධ්‍යයෙන් ගෙන මේ පරීක්ෂණයෙන් සමර්ථ වී පත්වීම් ලබන්නා වූ යථෝක්ත අපෙක්ෂකයන් සවකීය ප්‍රවාසන කාලය තුළ දී සිංහල උගත යුතු ය.

ප්‍රවාසන කාල සීමාව ඉකුත් වීමෙන් පසු ඒ අපෙක්ෂකයින්ගේ පත්වීම් ස්ථිර කරනු ලබන්නේ ඔවුන්ගේ වැඩ මෙන්ම හැසිරීම ද සතුටුදායක වී සිංහල පරීක්ෂණයකින් ද සමර්ථ වූ විටය.

සිංහල පරීක්ෂණයෙන් පහත සඳහන් සංඛ්‍යාවන්ට ඇතුළත් අය නිදහස් වෙති :—

(i) මහා භාණ්ඩාගාරයේ සිංහල ප්‍රවීනතා පරීක්ෂණයේ ඉහළ පෙළින් හෝ සාමාන්‍ය පෙළින් හෝ සාමාර්ථ්‍යය ලැබූ රජයේ සේවයෙහි නියුක්ත නව ප්‍රවේශකයින් ; හෝ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් හෝ ඉන් ඉහළ විභාගයකින් හෝ, සිංහල මාධ්‍යයෙන් සමත් වූ බවට සහතිකයක් ලැබූ අපෙක්ෂකයින් ; හෝ

(iii) මොනම මාධ්‍යයකින් වුවද පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයක "සිංහල භාෂාව" විෂයයෙන් සමත් වූ බවට සහතිකයක් ලැබූ අපේක්ෂකයින්.

අපෙක්ෂිත සිංහල භාෂා ප්‍රවීනත්වය ප්‍රවාසන කාලය තුළදී අත්කර ගැනීමට අපොහොසත් වන අය සේවයෙන් අස් කිරීමට ඉඩ තිබේ. එහෙත් රාජ්‍ය භාෂාව ඉගෙනීමෙහි ලා අවංක පරිශ්‍රමයක් දැරූහයි සර්වේ ජනරාල්ට හැඟේ නම්, ඔවුන් සේවයෙන් අස්කරනු නො ලැබේ. ඔවුන් සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල විභාගයෙන් සමර්ථ වුවහොත් නියමිත කාලය තුළ සමත් වන්නට බැරි වීම නිසා අඩු වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීමට සවකීය මනාපය පරිදි සර්වේ ජනරාල්ට පිළිවන් කම තිබේ.

**ශිෂ්‍යයන්ට ගෙවීම**

17. අධ්‍යාපනය අතින් ශිෂ්‍යයන් දක්වන දියුණුව සතුටුදායක නම් පුහුණුව ලබන කාලයේදී ඔවුන්ට මසකට රු. 75 බැගින් දීමනාවක් ද ආණ්ඩුවේ ගෙවීම් ක්‍රමය අනුව ඊට සරිලන ජීවන වියදම් දීමනාව හා විශේෂ ජීවනාධාර දීමනාව ද ගෙවනු ලැබේ.

**ක්ෂෙත්‍ර සේවයට පත් කිරීම**

18. (i) දෙවැනි ශ්‍රෙණියේ මිනින්දෝරුවන් වශයෙන් වැඩ භාර ගැනීමට සුදුසු බවට වාර්තා කරනු ලැබූ වහාම ශිෂ්‍යයෝ ඒ තනතුරුවලට පත් කරනු ලැබෙත්. මිනින්දෝරුවන් පත් කරනු ලබන්නේ අවුරුදු තුනක පරිවාස කාලයකට හෙවත් සෝදිසි කාලයකට යටත් වන සේ ය. එහෙත් එම කාලය ද විශ්‍රාම වැටුප් අයිතිවාසිකම්වලට ඇතුළත් වේ. එම කාලය ඇතුළත යම් අවස්ථාවකදී ඔවුන්ගේ වැඩ අසතුටුදායක බව පෙනී ගියහොත් හෝ ඔවුන් විෂමාචාරය ගැන වරදකරුවන් බව ඔප්පු වුවහොත් හෝ සර්වේ ජනරාල් විසින් ඔවුන් සේවයෙන් පහ කෙරෙනු ඇත. එබඳු අවස්ථාවකදී ඔවුහු සවකීය පුහුණුව සඳහා රජයෙන් වියදම් කරනු ලැබූ මුදල ද ආපසු ගෙවිය යුත්තෝ ය.

(ii) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි යන මේවාට සහ රජයේ කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හා රෙගුලාසිවලට ද යටත් වන්නේ ය.

(iii) කලින් කල සංශෝධනය වන පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු හා රජයේ සෙසු රෙගුලාසි ද අනුව ගෙවල් කුලී දීමනාවලට ද, නිවාඩුවලට ද ප්‍රසිද්ධ නිවාඩු දිනවලට ද ඔවුහු හිමි වෙති.

(vi) මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු රෙගුලාසි අනුව ගමන් වියදම් ද ගෙවනු ලැබේ.

**ජ්‍යෙෂ්ඨත්වය**

19. එකම දින පත්කරන ලද මිනින්දෝරුවන් අතර ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලබන්නේ අභ්‍යාස විද්‍යාලයීය අවසාන විභාගයෙන් ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාවට, ඔවුන් මුල් අවුරුදු තුනේ මිනින්දෝරුවන් වශයෙන් සේවය කළ කාලයේදී ලබා ගත් සේවා ලකුණු ද එකතු කිරීමෙනි. එහෙත් එම තීරණය මෙම දැන්වීමේ 16 (iii) වැනි අනුඡේදයේ කොන්දේසිවලට යටත් වේ.

**වැටුප් හා උසස් කිරීමේ කොන්දේසි**

20. (ii) වැනි ශ්‍රේණිය—රු. 1,620 වාර්ෂික වැටුපකින් ආරම්භ වී රු. 120 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 19කින් හා රු. 180 බැගින් වූ වැඩිවීම් 4කින් ද යුතුව රු. 4,620 දක්වා නගී. වාර්ෂික වැටුප රුපියල් 2,820 හා රුපියල් 3,900 ට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම් තිබේ.

(i) වැනි ශ්‍රේණිය—රු. 3,300 වාර්ෂික වැටුපකින් ආරම්භ වී රු. 120 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 5කින් හා රු. 180 බැගින් වූ වැඩිවීම් 8කින් ද යුතුව රු. 5,340 දක්වා නගී. වාර්ෂික වැටුප රු. 4,080 වන්නට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉමක් තිබේ.

විශෙෂ ශ්‍රේණිය—වාර්ෂික වැටුප රු. 5,580න් ආරම්භ වී රු. 240 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 5කින් යුතුව රු. 6,780න් අවසන් වේ.

මිනින්දෝරුවකු (i) වැනි ශ්‍රේණියට උසස් කරනුයේ දෙපාර්තමේන්තු කණිෂ්ඨ විභාගයෙන් ලබන සාමාර්ථ්‍යය අනුව ය. (ii) වැනි ශ්‍රේණියේ මිනින්දෝරුවකු වශයෙන් සේවයේ ස්ථිර කරනු ලැබීමෙන් පසු ඕනෑම විටක ඔහුට එම විභාගයට ඉදිරිපත් වීමට ඉඩ දෙනු ලැබේ. (i) වැනි ශ්‍රේණියට උසස් කිරීමට ඔහු රුපියල් 2,820 පඩිය පිට අවුරුද්දක් සේවය කළ යුතු ය. එසේම (i) වැනි ශ්‍රේණියේ පඩි ක්‍රමය අනුව රුපියල් 4,620 වාර්ෂික පඩියට පැමිණෙනතෙක් විශේෂ ශ්‍රේණියට උසස් වීමට ඔහුට අයිතිවාසිකමක් නැත.

මිනින්දෝරුවකු දෙපාර්තමේන්තු ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වීමෙන් පසුව විශේෂ ශ්‍රේණියට හෝ සර්වප්‍රකාරයෙන් ම යෝග්‍ය නම්, උප අධිකාරි ශ්‍රේණියට හෝ උසස් කිරීමට සුදුසු සේ සලකනු ලැබේ.

ඒ ඒ ශ්‍රේණිවලට උසස් කිරීමට ඉඩ ලැබෙන්නේ පුරප්පාඩු ඇති වන අන්දමිනි.

වැටුප් වැඩිවීම් ගෙවනු ලබන්නේ, නිලධාරියා තමාට භාර වූ රාජකාරිය නිසියාකාරව ඉටු කළ බවට සර්වේ ජනරාල්ට ඒත්තු ගියහොත් පමණකි.

21. අපේක්ෂකයින් අයදුම් පත් පෝර්මය ඉල්ලා එවන විට ඒ සමඟම තමන්ගේ වයස අධ්‍යාපනික සුදුසුකම් ද සඳහන් කරන ලෙස දැනුම් දෙනු ලැබේ.

22. අවශ්‍ය සුදුසුකම් නැති අපේක්ෂකයින් විසින් එවනු ලබන ලියුම්වලට පිළිතුරු යවනු නොලැබේ.

23. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස්වරයා විසිනි.

කොමසාරිස්වරයා විසින් අපේක්ෂකයන් සඳහා සම්පාදිත ව්‍යවස්ථාවලට ද අපේක්ෂකයෝ යටත් විය යුත්තෝය.

වී. රාසරත්නම්,
සර්වේ ජනරාල්.

1960 ජූනි 24 වැනි දින,
සර්වේ ජනරාල් කාර්යාලය,
"සී" ශාඛාව,
තැ. පෙ. 506, කොළඹ.

**සංලක්ෂ්‍යය.**—මේ පරීක්ෂණය පිළිබඳ කිසි ද ලිපියක් සර්වේ ජනරාල් වෙත ඔහුගේ පෞද්ගලික නාමට නො යැවිය යුතුයි.

---

## පේරාදෙණියේ සහ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාල සහතික පත්‍ර අභ්‍යාසය

පේරාදෙණියේ හා කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයන්හි දෑවුරුදු සහතිකපත්‍ර අභ්‍යාසයන් සඳහා 1960 අගෝස්තු මස 15 වැනි දින දක්වා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. මේ අභ්‍යාස පංතියට පිරිමි සහ ගැහැණු අයදුම්කරුවන්ට ඉල්ලුම් කළ හැක. අයදුම්කරුවන් පහත දැක්වෙන සුදුසුකම් ඇත්තවුන් විය යුතුය :—

**වයස.**—1960 ඔක්තෝබර් මස 1 වැනි දින වන විට වයස අවුරුදු 17ටත් 23ටත් අතර විය යුතුය.

**අධ්‍යාපනික සුදුසුකම්.**—ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලා අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ සහතිකපත්‍ර විභාගයෙන් සමත් සහ අවුරුද්දක් ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලාවක ඉගෙනීම ලබාගත් සහතිකයද ඇත්තවුන් විය යුතුය.

**එක එල්ලේම ඇතුල්වන්ට අදහස් කරන අයදුම්කරුවන්.**—පිරිමි ළමුන් රසායනික විද්‍යාව විෂයයක් වශයෙන් ගෙන ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටිය යුතුය. නැතහොත් ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය දක්වා රසායන විද්‍යාව හදාරා ඒ පිළිබඳ දැනීමක් ලබා සිටිය යුතුය.

**ගැහැණු ළමුන්.**—රසායනික විද්‍යාව හෝ වෙනයම් විද්‍යාත්මක විෂයයක් හෝ ගෘහ විද්‍යා විෂයයක් සමග ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටිය යුතුය.

ගැහැණු ළමුන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයට ඇතුල්වීම සඳහා පමණකි.

පේරාදෙණියේ කෘෂිකර්ම විද්‍යාලයේ උගැන්වීමේ මාධ්‍යය සිංහල භාෂාව පමණක් වන අතර කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ උගැන්වීමේ මාධ්‍යය සිංහල හෝ දෙමළ වනු ඇත. සිංහල හෝ දෙමළ මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන දේශනා පංතිවල උගෙනීම ලැබ සිංහල හෝ දෙමළ භාෂාවෙන් පාඨ පරීක්ෂණවලට පෙනී සිටීමේ හැකියාවක් අයදුම්කරුවන් තුළ තිබිය යුතුය.

ජ්‍යෙෂ්ඨ සහතිකපත්‍ර විභාගයේදී රසායනික විද්‍යාවෙන් සමත් නොවූ අයදුම්කරුවන් වෙතොත් ඔවුන් රසායනික විද්‍යාව පිළිබඳ අවශ්‍ය දැනුම ලබා ඇති බවට තමන් අවසාන වරට උගෙනීම ලැබූ විද්‍යාලයේ විද්‍යාලයාධිපති තැනගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. විභාග ප්‍රතිඵල බලාපොරොත්තුවෙමින් සිටින අපේක්ෂකයන්හටද අයදුම්පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

වැඩි විස්තර සහ අයදුම්පත් පෝර්ම පිළිබඳ සියලුම විමසීම් පේරාදෙණියේ කෘෂිකර්ම විද්‍යාලයේ විද්‍යාලයාධිපති තැන වෙත හෝ කුණ්ඩසාලයේ කෘෂිකර්ම විද්‍යාලයාධිපති තැන වෙත හෝ එවිය යුතුය.

ඒ. වී. රිචර්ඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960.5.21.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## 1960-61 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත් උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසින ලද ආහාර සැපැයීම

බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත් උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් 1960 ඔක්තෝබර් මස 1 වැනිදා සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා මුළු අවුරුදු කාලය තුළ, පිසනු ලැබූ ආහාර සැපයීම සඳහා උපලේඛනයෙහි සඳහන් දින වල පෙරවරු 10 දක්වා ඒ ඒ බන්ධනාගාර අධිකාරීන් විසින් ටෙන්ඩර් ලාංකිකයන්ගෙන් (ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.) භාරගනු ලැබේ. එම දිනවල පෙරවරු 10.05 ට ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එහි පෙනී සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් ආහාර සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී ඉලක්කමින් මෙන් ම වචනයෙන් ද ඒවා සඳහන් කළ යුතුව ඇත. ඉලක්කමින් සඳහන් මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේ දී අසමානත්වයක් ඇතිවී තිබුණහොත් හෝ, මිළ ගණන් වචනයෙන් සඳහන් වී නැතිනම් හෝ එබඳු ටෙන්ඩර් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත්තේ ය.

3. ආහාර සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් වේ.
උදේ භෝජනය :—

(අ) ආප්ප හෝ ඉඳිආප්ප අවුන්ස 6 කට නොඅඩු විය යුතුයි.

(ආ) හකුරු අවුන්ස එකක් හෝ සම්බෝල.

(ඇ) සීනි දමන ලද තේ කෝප්පයක්.

දිවා භෝජනය :—

(අ) හාල් අවුන්ස 8 ප්‍රමාණයේ තැම්බූ බත් පිඟානක්.

(ආ) හරක් මස් හෝ මාලු හෝ කරවල අවුන්ස 2 යි.

(ඇ) එළවළු ව්‍යංජන දෙකයි. එක ව්‍යංජනයක් අවුන්ස 2 ප්‍රමාණය විය යුතුයි.

සැ. යු.—සලාක කිරීම නිසා නොහොත් වෙනත් ප්‍රමාණවත් හේතුවක් නිසා සම්පූර්ණ ආහාර ප්‍රමාණයක් හෝ ඉන් කොටස්

හෝ සැපයිය නොහැකි නම්, අධිකාරීතැනගේ අභිමතය පරිදි කොන්ත්‍රාත්තුවට බැඳී ඇති වෙළඳ මිළ ප්‍රමාණයට සැහෙන සේ ආදේශක ආහාර සැපැයීමට කොන්ත්‍රාත්කරුවනට පිළිවන.

4. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා උපලේඛනයේ සඳහන් අධිකාරී තැන වෙත රෙජිස්ටර් තැපැලෙන් යැවිය යුතුයි. රෙජිස්ටර් තැපැලෙන් නො යවන ටෙන්ඩර් පත්‍ර එම අධිකාරී තැනට හෝ ඔහු විසින් පත් කරන ලද බලය ලත් නියෝජිතයෙකු වේ නම් ඔහුට හෝ භාරදී එය භාරගත් බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ 1960-61 වර්ෂය තුළ බන්ධනාගාර සහ සිරසැල්වල සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසන ලද ආහාර සැපැයීමේ ටෙන්ඩරය" යැයි ලියා උප ලේඛනයෙහි සඳහන් දිනවල මෙහි 1 වැනි ඡේදයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරී තැනට ලැබිය යුතුසේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත ෆෝරම ඒ ඒ ආයතන භාර අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. නියමිත ෆෝරමයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් භාර ගැනීම නතර කළ දින සිට සති 8ක් යනතුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර්කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත උපලේඛනයෙහි සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර අධිකාරීන්ගේ කාර්යාලවල හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ (කොළඹ කච්චේරිය හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝරම ලබාගත හැකිය.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10 ඇතුළතදී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීම පුළුවන් නොවිනි නම් හෝ එසේ කිරීමෙන් වැළැකී සිටිනම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වන සේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන්, ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවනට සිදුවෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අය කර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත්, හෝ නො එසේ ව එහි ගෙන ගොස් භාර දුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු, එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවෝ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන බවට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

11. සේවය නිසියාකාර ඉටු කිරීමේදී දත යුතු සියලුම අවශ්‍ය කරුණු දැනගැනීම සඳහා උප ලේඛනයේ සඳහන් අධිකාරීවරුන් ගෙන් විමසනු මැනවි.

12. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමග කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන්, අදහස් කළ යුත්තේද, ගිණිය යුත්තේද, ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නාවූද නිලධාරියාද ඔහුට පසුව එම පදවිය දරන්නාවූ නිලධාරියාද වේ.

ව. නා. පිල්ලේ,
බන්ධනාගාර කොමසාරිස්.

1960 ජූලි මස 1 වැනිදා,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේදීය.

## උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ශ. | ඇප මුදල රු. | ශ. | ටෙන්ඩර් භාරගන්නා නිලධාරියා |
| --- | --- | --- | --- | --- | --- |
| (1) අවිස්සාවේල්ල බන්ධනාගාර සිරසැල සහ උසාවිය | 25 | 0 | 100 | 0 | වැලිකඩ බන්ධනාගාර අධිකාරී |
| රත්නපුර සිරසැල සහ උසාවිය | 25 | 0 | 100 | 0 | එම |
| බලන්ගොඩ සිරසැල සහ උසාවිය | 5 | 0 | 25 | 0 | එම |
| රක්වාන සිරසැල සහ උසාවිය | 5 | 0 | 25 | 0 | එම |
| (2) වැලිකඩ සහ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය | 25 | 0 | 150 | 0 | කොළඹ රිමාන්ඩ් අධිකාරී |
| අලුත්කඩේ බන්ධනාගාරය සහ කොළඹ උසාවිය | 25 | 0 | 150 | 0 | එම |
| පානදුරේ සිරසැල සහ උසාවිය | 10 | 0 | 50 | 0 | එම |
| කළුතර සිරසැල සහ උසාවිය | 10 | 0 | 50 | 0 | එම |
| මතුගම මහේස්ත්‍රාත් උසාවිය | 5 | 0 | 25 | 0 | එම |
| හොරණ මහේස්ත්‍රාත් උසාවිය | 5 | 0 | 25 | 0 | එම |
| (3) කුලියාපිටිය සිරසැල සහ උසාවිය | 25 | 0 | 150 | 0 | මහර බන්ධනාගාර අධිකාරී |
| ගම්පහ සිරසැල සහ උසාවිය | 10 | 0 | 50 | 0 | එම |
| (4) බෝගම්බර සහ නුවර රිමාන්ඩ් බන්ධනාගාරය සහ උසාවිය | 50 | 0 | 200 | 0 | නුවර බන්ධනාගාර අධිකාරී |
| කුරුණෑගල සිරසැල සහ උසාවිය | 50 | 0 | 200 | 0 | එම |
| මාතලේ සිරසැල සහ උසාවිය | 10 | 0 | 50 | 0 | එම |
| ගම්පල සිරසැල සහ උසාවිය | 5 | 0 | 25 | 0 | එම |
| හැටන් සිරසැල සහ උසාවිය | 25 | 0 | 150 | 0 | එම |
| (5) බදුල්ල බන්ධනාගාරය සහ සිරසැල | 10 | 0 | 50 | 0 | බදුල්ල බන්ධනාගාර අධිකාරී |
| නුවර එළිය බන්ධනාගාර සිරසැල සහ උසාවිය | 10 | 0 | 50 | 0 | එම |
| බන්ඩාරවෙල මහේස්ත්‍රාත් උසාවිය | 5 | 0 | 25 | 0 | එම |
| (6) ගාල්ල බන්ධනාගාරය සහ උසාවිය | 25 | 0 | 100 | 0 | ගාල්ල බන්ධනාගාර අධිකාරී |
| බලපිටිය සිරසැල සහ උසාවිය | 10 | 0 | 50 | 0 | එම |
| (7) මාතර බන්ධනාගාරය සහ සිරසැල | 25 | 0 | 100 | 0 | මාතර බන්ධනාගාර අධිකාරී |
| වලස්මුල්ල මහේස්ත්‍රාත් උසාවිය | 5 | 0 | 25 | 0 | එම |
| තංගල්ල බන්ධනාගාරය සහ උසාවිය | 10 | 0 | 50 | 0 | එම |
| හම්බන්තොට බන්ධනාගාරය සහ උසාවිය | 5 | 0 | 25 | 0 | එම |
| (8) අනුරාධපුර බන්ධනාගාර සහ උසාවිය | 25 | 0 | 100 | 0 | අනුරාධපුර බන්ධනාගාර අධිකාරී |
| පොළොන්නරුව බන්ධනාගාර සිරසැල සහ උසාවිය | 5 | 0 | 25 | 0 | එම |
| ත්‍රිකුණාමල බන්ධනාගාර සිරසැල සහ උසාවිය | 25 | 0 | 100 | 0 | එම |

o

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | ඇප මුදල රු. ශ. | ටෙන්ඩර් භාරගන්නා නිලධාරියා |
|---|---|---|---|
| (9) මීගමුව රිමාන්ඩ්සිරසැල සහ උසාවිය | 10 0 | 50 0 | මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල අධිකාරී |
| කනුවන මහේස්ත්‍රාත් උසාවිය | 5 0 | 25 0 | එම |
| හලාවත සිරසැල සහ උසාවිය | 10 0 | 50 0 | එම |
| පුත්තලම සිරසැල සහ උසාවිය | 10 0 | 50 0 | එම |
| (10) යාපනයේ බන්ධනාගාරය සහ රිමාන්ඩ් උසාවිය | 25 0 | 100 0 | යාපනයේ බන්ධනාගාරය උප අධිකාරී |
| මල්ලකම් සිරසැල සහ උසාවිය | 5 0 | 25 0 | එම |
| පොයින්ට්පේද්‍රූ සිරසැල සහ උසාවිය | 5 0 | 25 0 | එම |
| චාවකච්චේරියේ සිරසැල සහ උසාවිය | 5 0 | 25 0 | එම |
| කයිට්ස් සිරසැල සහ උසාවිය | 5 0 | 25 0 | එම |
| මන්නාරමේ සිරසැල සහ උසාවිය | 5 0 | 25 0 | එම |
| වව්නියාවේ සිරසැල සහ උසාවිය | 5 0 | 25 0 | එම |
| මුලතිව් සිරසැල සහ උසාවිය | 5 0 | 25 0 | එම |
| (11) මඩකලපුවේ බන්ධනාගාරය සහ උසාවිය | 25 0 | 100 0 | මඩකලපුවේ බන්ධනාගාර අධිකාරී |
| කල්මුණේ බන්ධනාගාරය සිරසැල සහ උසාවිය | 25 0 | 100 0 | එම |

ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය : 1960 ජූලි මස 26 වැනිද

උපලේඛනයෙහි දැක්වෙන පරිදි වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කළ යුතු බව දැනගත මැනවි.

---

## වාරි මාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරි මාර්ග ඉංජිනේරු තැන විසින් 1960 ජූලි මස 26 වෙනි අඟහරුවාදා පෙරවරු 11.30 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ මගුරුමස්විල මහකුඹුර අමුනට ගංවතුරෙන් වූ හානි අළුත්වැඩියා කිරීම සහ අමතර දොරටු වක් සැපයීම සඳහා වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000ට සහ ඊට වැඩියෙන් ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කළුතර වාරි මාර්ග ඉංජිනේරු තැන විසින් 1960 ජූලි මස 6 වෙනි දින සිට 22 වෙනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමේදී රු. 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට රිසිට් පතක් හෝ වාරි මාර්ග අධ්‍යක්ෂක තුමා නමට රු. 25ක මුදල් ඕඩරයක් ඉදිරිපත් කළ යුතුයි.

3. ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීම රජය සතුය.

4. වැඩි විස්තර කළුතර වාරි මාර්ග ඉංජිනේරු තැන ගෙන් විමසන්න.

ඊ. රණසිංහ,
කළුතර වාරි මාර්ග ඉංජිනේරු තැන.

වාරි මාර්ග කාර්යාලය,
කළුතර, 24. 6. '60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රුපියල් 45,000ක් හෝ ඊට වැඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුතුරාජවෙල ලුනු වතුර අස්කිරීමේ ව්‍යාපාරයේ ගවයන් එහා මෙහා ගෙනයෑම සඳහා සුදුසු තැන් 20 ක් සෑදීමට 1960 ජූලි 22 වෙනි සිකුරාද උදය 11.30 වන තෙක් පහත සඳහන් ලිපිනයට ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

බස්නාහිර පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා,
කොටාරෝඩ්, කොළඹ 8.

ටැන්ඩර් පත්‍ර අනුපිටපතක් සමග එවිය යුතුයි. ආකෘති පත්‍ර කොළඹ 9යේ, වේලුවනා පාරේ කොළඹ උප ප්‍රාදේශීය කායඝාලයේ වාරිමාර්ග ඉන්ජිනේරු මහතාගෙන් ලබා ගත හැක. එම කායඝාලයෙන්ම වැඩි විස්තර ලබා ගැනීමට සහ සැලැස්ම බලා ගැනීමට පුලුවන.

කොළඹ 9යේ වේලුවනාපාරේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තු කායඝාලයෙන් හෝ ඕනෑම කච්චේරියකින් ටැන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 50ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් රුපියල් 45,500 හෝ ඊට වැඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි බව් ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත්කරුවන්ට 1960 ජූලි මස 20 වෙනි බදාදා සවස 4.30 වනතෙක් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. කිසිම විමසීමක් නොමැතිව ඕනෑම ටැන්ඩරයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ සියලුම ටැන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

එෆ්. ඒ. ලෝබෝ,
කොළඹ උප ප්‍රාදේශීය වාරිමාර්ග
ඉන්ජිනේරු තැන.

වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කායඝාලය,
වේලුවන පාර, කොළඹ 9.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රුපියල් 16,000ක් හෝ ඊට වැඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුතුරාජවෙල ව්‍යාපාරයේ වතුර ඇතුල්වීමේ හා පිටවීමේ ඇළවල් කැපීම සඳහා 1960 ජූලි මස 22 වෙනි සිකුරාද උදය 11.30 වන තෙක් පහත සඳහන් ලිපිනයට ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

බස්නාහිර පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා,
කොටාරෝඩ්, කොළඹ 8.

ටැන්ඩර් පත්‍ර අනුපිටපතක් සමග එවිය යුතුයි. ආකෘති පත්‍ර කොළඹ 9යේ, වේලුවනා පාරේ කොළඹ උප ප්‍රාදේශීය කායඝාලයේ වාරිමාර්ග ඉන්ජිනේරු මහතාගෙන් ලබා ගත හැක. එම කායඝාලයෙන්ම වැඩි විස්තර ලබා ගැනීමට සහ සැලැස්ම බලා ගැනීමට පුලුවන.

කොළඹ 9යේ වේලුවනාපාරේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තු කායඝාලයෙන් හෝ ඕනෑම කච්චේරියකින් ටැන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් රුපියල් 18,500 හෝ ඊට වැඩි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි බව ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත්කරුවන්ට 1960 ජූලි මස 20 වෙනි බදාදා සවස 4.30 වනතෙක් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. කිසිම විමසීමක් නොමැතිව ඕනෑම ටැන්ඩරයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ සියලුම ටැන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

එෆ්. ඒ. ලෝබෝ,
කොළඹ උප ප්‍රාදේශීය වාරිමාර්ග
ඉන්ජිනේරු තැන.

වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කායඝාලය,
වේලුවන පාර, කොළඹ 9.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බටහිර දිසාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන කෝට්ටේ පාර, කොළඹ 8. විසින් ගොඩනැගිලි උප කොට්ඨාශය යටතේ ජාවත්තේ අභිනව ප්‍රධාන වාරිමාර්ග කාර්යාලයයේ අභ්‍යන්තර දුරකථනය ශබ්ද වාහිනී ක්‍රමය ඇති කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 13,500 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් 1960 ජූලි මස 22 වෙනි සිකුරාද පෙරවරු 11.30 වන තෙක් මුද්‍රා තැබූ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කොළඹ 5, ජාවත්ත පාරේ පිහිටි ගොඩනැගිලි උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් 1960 ජූලි මස 20 වෙනි බදාදා තෙක් ලබාගත හැකි ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් ද සමගය. සැලැස්ම සහ අවශ්‍ය වෙනත් විස්තර මෙහිදී ලබාගත හැකිය.

ඕනෑම කච්චේරියක හෝ පහත සඳහන් කාර්යාලයේ හෝ රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග තම සුදුසුකම් ඉදිරිපත් කරන අයට පමණක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ ලබාගෙන සිටින කොන්ත්‍රාත් කරුවන් එම වැඩය සතුටුදායක අන්දමින් කරගෙන යන බවට එම වැඩය භාර නිළධාරීන්ගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමේදී ඉදිරිපත් කළ යුතුයි.

වී. කුමාරස්වාමි,
ගොඩනැගිලි උප කොට්ඨාශය භාර
ඉංජිනේරු තැන.

වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයය,
ගොඩනැගිලි උප කොට්ඨාශය,
ජාවත්ත පාර, කොළඹ 5.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දක්ෂිණ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 ජූලි මස 28 වෙනි දින පෙරවරු 10 දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඇඹිලිපිටිය උප කොට්ඨාශයේ වාරිමාර්ග කාර්යාලයට සහ කඳවුරට ප්‍රවේශ වන පාරවල ගල් දමා තාර දැමීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 6,000 සහ ඊට වඩා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ඇඹිලිපිටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුයි.

3. 1960 ජූලි මස 22 වෙනි සිට 25 වෙනි දින දක්වා (දෙදිනම ඇතුළුව සහ අවසාන දින සවස 3 දක්වා පමණක්) කාර්යාල වේලාවල්වලදී ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම සඳහා ඕනෑම කච්චේරියක රුපියල් 25ක් තැන්පත් කර ලබාගත්තා ලද කුවිතාන්සියද ලියාපදිංචි කරන ලද පොත්ද ඉදිරිපත් කළ යුතුයි. දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය එම වැඩ භාර නිලධාරීන්ගෙන් එම වැඩය හෝ වැඩ සතුටුදායක ලෙසට කරගෙන යන බවට සහ දැනට ආණ්ඩුව යටතේ තිබෙන වැඩ ප්‍රමාණය ගැනද සහතික ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය සම්පූර්ණ රජය සතුය.

ඇම්. ජේ. ඇෆ්. ආර්. සේනාරත්න,
ඇඹිලිපිටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය, ඇඹිලිපිටිය,
1960.6.23.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ දකුණු ඉවුරේ සොරොව්ව (පළමුවන පියවර) සෑදීම සඳහා 1960 ජූලි මස 27 වෙනි බුද දින පෙ.ව. 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ ඉංජිනේරු තැනගෙන් ලබාගත් පෝර්ම පිටපත් දෙකක ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම පෝර්ම නිසිලෙස පුරවා කොන්ත්‍රාත්කරුගේ අත්සන සහ දැනම යොදා කවරයක බහා සීල් තබා එවිය යුතුය. ලියුම් කවරයේ උඩ වම් කෙලවරෙහි වැඩයේ නම සඳහන් කළ යුතුය. මෙම ටැන්ඩර් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ලියාපදිංචිකළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම් එතුමාගේ කායාලයේ ඇති ටැන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. මෙම වැඩයට අදාල සියළුම තොරතුරු හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් විමසා දැනගත හැකි අතර සිතියම් ආදිය එතුමාගේ කායාලයේදී පරීක්ෂා කළ හැක.

3. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් පෝර්ම නිකුත්කරනු ලබන්නේ 1960 ජූලි මස 26 වෙනි දින දහවල් දොලහ දක්වා පමනි. මෙම දෙපාර්තමේන්තුවේ රු. 10,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති බව ඔප්පුකළ හැකි කොන්ත්‍රාත්කරුවනට පමණක් ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. මෙම පෝර්ම ලබාගැනීමේදී රු. 25ක මුදලක් තැන්පත් කොට ඒ සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. වාරිමාර්ග අධ්‍යක්ෂක තැන වෙනුවෙන් මෙම මුදල කුරුණෑගල කච්චේරියේ තැන්පත් කළ හැක.

වාරිමාර්ග ඉංජිනේරු තැන,
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය.

මකුල්පොත, ඉබ්බාගමුව.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පුත්තලම උප කොට්ඨාශයේ කොට්ටුකච්චිය වැව් බැම්ම පළල් කර ශක්තිමත් කිරීම සඳහා, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 17,000 හෝ ඉන් ඉහල ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් 1960 ජූලි මස 13 වැනි බදාදා පෙරවරු 9.30 තෙක් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. අනු පිටපතක්ද සමග එවිය යුතු ටෙන්ඩර් පත් පුත්තලම උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබා ගත හැකි අතර එම කායාලයේදී අදාල සැලැස්මද බැලිය හැක.

3. 1960 ජූලි මස 11 වන සඳුදා තෙක් නිකුත් කෙරෙන ටෙන්ඩර් පත්, ප්‍රථම ඡේදයේ සඳහන් කොන්ත්‍රාත්කරුවන් බවට සෑහෙන සාධක දක්වා සිටින හා කච්චේරියක හෝ පුත්තලම වාරිමාර්ග ඉංජිනේරු කායාලයේ හෝ රු. 25 තැන්පත් ටෙන්ඩර් මුදලකට කුවිතාන්සියක් ඉදිරිපත් කරන්නවුනට ලබාගත හැක.

පී. මුත්තයියා,
වාරිමාර්ග ඉංජිනේරුතැන, පුත්තලම.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් වර්ෂ 1960 ජූලි මස 27 වැනි බුද දින පෙරවරු 9.30 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්කිස්ස බැම්ම ව්‍යාපාරය යටතේ වාන් ඇලක්, රෙගුලේටරයක් සහ වානක් සෑදීම සඳහා ටැන්ඩර් භාරගනු ලැබේ.

කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත් පෝර්ම පිටපත් දෙකක ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම පෝර්ම නිසිලෙස පුරවා කොන්ත්‍රාත්කරුගේ අත්සන සහ දාතම යොදා සීල් තබන ලද කවරයක බහා එවිය යුතුය. මෙම ටැන්ඩර් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම් එතුමාගේ කාර්යාලයෙහි ඇති "ටැන්ඩර් පෙට්ටියෙහි" තැන්පත් කළ යුතුය.

කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ වර්ෂ 1960 ජූලි මස 26 වැනි දින පස්වරු 3 දක්වා පමණි. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 45,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති බව ඔප්පු කළ හැකි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මෙම පෝර්ම ලබාගත හැක. මෙම පෝර්ම ලබාගැනීමේදී රුපියල් 50ක මුදලක් තැන්පත් කොට ඒ සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. මේ මුදල කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ කුරුණෑගල කච්චේරියේ තැන්පත් කළ හැකිය.

ඇන්. ටී. කෝට්ටෙගොඩ,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
කුරුණෑගල උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය, කුරුණෑගල,
23.6.60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් වර්ෂ 1960 ජූලි මස 27 වැනි බුද දින පෙරවරු 9.30 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ නෙල්ලිය වාරිමාර්ග පහසුකම් සඳහා "මෙල්ල ඇල හරහා අමුණක් බැඳීම" සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත් පෝර්ම පිටපත් දෙකක ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම පෝර්ම නිසිලෙස පුරවා කොන්ත්‍රාත්කරුගේ අත්සන සහ දාතම යොදා සීල් තබන ලද කවරයක බහා එවිය යුතුය. මෙම ටැන්ඩර් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම් එතුමාගේ කාර්යාලයෙහි ඇති "ටැන්ඩර් පෙට්ටියෙහි" තැන්පත් කළ යුතුය.

කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ වර්ෂ 1960 ජූලි මස 26 වැනි දින පස්වරු 3 දක්වා පමණි. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 35,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති බව ඔප්පු කළ හැකි කොන්ත්‍රාත්

කරුවන්ට පමණක් මෙම ෆෝර්ම ලබාගත හැක. මෙම ෆෝර්ම ලබා ගැනීමේදී රුපියල් 50ක මුදලක් තැන්පත් කොට ඒ සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. මේ මුදල කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ කුරුණෑගල කච්චේරියේ තැන්පත් කළ හැකිය.

ඇන්. ටී. කෝට්ටෙගොඩ,
වාරිමාගී ඉංජිනේරු තැන,
කුරුණෑගල උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය, කුරුණෑගල,
25.6.60.

---

## වාරිමාගී දෙපාතීමේන්තුව

මෙහි පහත සඳහන් හුරුලු වැව උප කොටස යටතේ කෙරෙන වැඩවලට උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් 1960 ජූලි මස 27 වෙනි බදාදා සවස 2 දක්වා එක් එක් වැඩය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ:—

1. හොරවපතාන වැවේ ගංවතුරින් කැඩී බිඳී ගිය තැන් අලුත්වැඩියා කිරීම.
2. අඹබතල වැවේ ගංවතුරින් කැඩී බිඳී ගිය තැන් අලුත්වැඩියා කිරීම.
3. කල්පේ වැව අලුත්වැඩියා කිරීම.

1960 ජූනි මස 30 වෙනිදා සිට 1960 ජූලි මස 26 වෙනි අඟහරුවාදා සවස 3 දක්වා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ඒවා නිකුත් කරනු ලබන්නේ වාරිමාගී දෙපාර්තමේන්තුවේ රු. 15,000 හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි බව ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත්කරුවනට සහ ඒ අය එක් එක් ටෙන්ඩරය සඳහා රු. 25ක් ඕනෑම කච්චේරියක හෝ මෙගොඩවැව පිහිටි හුරුලු වැව උප කොටසේ වාරිමාගී කායඞාල යේ තැන්පත් කළ බවට රිසිට් පතක් ඉදිරිපත් කළ අයට පමණි.

හුරුලු වැව උප කොටසේ හුරුලු වැව උප කොටස භාර නිලධාරි තැන ගෙන් ටෙන්ඩර් ෆෝර්ම සහ වැඩි විස්තර ලබාගත හැක. ටෙන්ඩර් ෆෝර්ම පිටපත් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුය.

ඒ. ආර්ජ්. මහගමගේ,
හුරුලු වැව උප කොටස භාර නිලධාරි තැන,
හුරුලු වැව උප කොටස.

1960 ජූනි මස 25 වැනි දින,
මෙගොඩ වැව.

---

## වාරි මාගී දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත භාර අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාගී ඉන්ජිනේරු තැන විසින් අනුරාධපුර උප කොට්ඨාශයට අයත් කනිෂ්ඨ ලිපිකරු නිවාස සහිර ගොඩනැගිලි 6ක් වන්නියන්කුලම පෙදෙසේ ඉදිකිරීම සඳහා වෂී 1960 ජූලි මස 27 වැනි බදාදා පස්වරු 2.30 වන තෙක් වෙන් වශයෙන් ටැන්ඩර් භාරගනු ලැබේ.

2. මෙම ටැන්ඩර සඳහා දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් සුදුස්සෝ වෙති.

3. සෑම ටැන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා ෆෝර්ම කොල සහ සියළු විස්තර මිහින්තලේ, මහකනදරාව වාරි මාගී ඉන්ජිනේරු තැනගෙන් ලබාගත හැකිය. 1960 ජූලි මස 9 වැනි දින සිට 23 වැනි සෙනසුරාදා දක්වා ෆෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

4. ටැන්ඩර ෆෝරම දෙනු ලබන්නේ කච්චේරියක හෝ මහකනදරාව වාරි මාගී කායඞාලයෙහි රුපියල් 25 තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කරන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවූ බවට සහතික පෙන්විය හැකි කොන්ත්‍රාත්කරුවන්ට පමණි.

5. ටැන්ඩර් භාරගැනීම අවසානකරන දින පස්වරු 3 ට අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාගී ඉන්ජිනේරුතුමා විසින් ටැන්ඩර් විවෘත කර බලන අවස්ථාවේ ටැන්ඩරකරුවන්ට පැමිණ සිටිය හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වාරි මාගී ඉන්ජිනේරු,

මහකනදරාව උප කොට්ඨාශය.
1960 ජූනි මස 20 වැනි දින,
මිහින්තලේ.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වාරියපොළ ගොවිපොළේ පොල් විකිණීම

කුරුණෑගල, මල්ලවපිටියේ කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන විසින් වාරියපොළ ගොවිපලෙහි ඇති පොල් 18,000ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1960 ජූලි 22 වෙනි දින පස්වරු 2.30 වන තුරු භාරගනු ලැබේ.

2. කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන ගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, මල්ලවපිටිය, කුරුණෑගල" යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "වාරියපොල ගොවිපලේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක්ද සහිතව සීල් තබන ලද කවරය තුළ බහා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවනොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර්පත්‍ර බහාලන ලද කවරයේ "වාරියපොල ගොවිපලෙහි පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර්පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් දින දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත්කර ගත යුතුයි. එසේ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර්පත්‍රයක් ටෙන්ඩර්පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්‍ෂක වෙත තබාගනී.

9. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934ජේ 19 වෙනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව තබා ගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂතැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දක්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත පොල්වලට ගෙවා ඉවත්කර ගත යුතුයි.

16. පිළිගත් ටෙන්ඩර්කරු පොල් සියල්ලටම සම්පූර්ණ මුදල ගෙවා ඉවත් කර ගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ දෙනු නොලැබේ.

පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකු ගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

(8) **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(9) **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දුපත්‍රය අත්සන් කළ යුතුය.

(10) **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලා පොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

(11) **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම්පත්‍රයක් මගින් පුළුවන.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍යසේවා දෙපාර්තමේන්තුව,
මුදල් අංශය, ගාලු මුවදොර,
මහලේකම් කාර්යාලය,
කොළඹ, 27.6.60.

## 4 වැනි ලේඛනය සම්බන්ධයි

| සේවය | ප්‍රදේශය | | යැවිය හැකි ප්‍රමාණය | අවසාන දිනය |
|---|---|---|---|---|
| **අනුරාධපුර කොට්ඨාශය** | | | | |
| අනුරාධපුර දුම්රිය පොළේ සිට අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට ඔහුගේ පාලනය යටතේ පවතින කිරි මධ්‍යස්ථානවලට | අනුරාධපුරය | ... | 13,020 | 28.7.60 |
| කැකිරාව දුම්රියපොළේ සිට කැකිරාව සෞඛ්‍ය කාර්යාලයට සහ කැකිරාව සෞඛ්‍ය කාර්යාලයේ සිට කැකිරාව සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කැකිරාව | ... | 5,078 | |
| තිරිකුණාමළය දුම්රියපොළේ සිට තිරිකුණාමළය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | තිරිකුණාමළය | ... | 3,150 | |
| **මඩකළපු කොට්ඨාශය** | | | | |
| මඩකළපු දුම්රියපොළේ සිට මඩකළපු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මඩකළපුව | ... | 4,030 | |
| වේලවෙන දුම්රියපොළේ සිට වේලවෙන සෞඛ්‍ය කාර්යාලයට සහ සෞඛ්‍ය කාර්යාලයේ සිට කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | වේලවෙන | ... | 7,936 | |
| **කොළඹ කොට්ඨාශය** | | | | |
| ගම්පහ දුම්රියපොළේ සිට ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ගම්පහ | ... | 13,361 | |
| කොච්චිකඩේ සෞඛ්‍ය කාර්යාලයේ සිට කොච්චිකඩේ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කොච්චිකඩේ | ... | 8,000 | |
| වල්පිට රජයේ ගොවිපළේ සිට කොච්චිකඩේ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කොච්චිකඩේ | ... | 2,750 | |
| වෙයන්ගොඩ දුම්රියපොළේ සිට කිරිඳිවැල සෞඛ්‍ය කාර්යාලයට සහ කිරිඳිවැල සෞඛ්‍ය කාර්යාලයේ සිට කිරිඳිවැල සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කිරිඳිවැල | ... | 6,789 | |
| මීගමු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට මීගමු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මීගමුව | ... | 8,036 | |
| මීරිගම දුම්රියපොළේ සිට සෞඛ්‍ය කාර්යාලයට සහ මීරිගම සෞඛ්‍ය කාර්යාලයේ සිට මීරිගම සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මීරිගම | ... | 11,780 | |
| මීරිගම සෞඛ්‍ය කාර්යාලයේ සිට මීරිගම සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මීරිගම | ... | 1,550 | |
| **ගාලු කොට්ඨාශය** | | | | |
| ගාලු දුම්රියපොළේ සිට ගාලු කඩවත් සතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට ගාලු කඩවත් සතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ගාල්ල | ... | 6,480 | 2.8.60 |
| හික්කඩුව දුම්රියපොළේ සිට බද්දෙගම සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය කාර්යාලයේ සිට බද්දෙගම සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | බද්දෙගම | ... | 2,220 | |
| අම්බලන්ගොඩ දුම්රියපොළේ සිට අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | අම්බලන්ගොඩ | ... | 6,900 | |
| **කළුතර කොට්ඨාශය** | | | | |
| කළුතර ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට කළුතර ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කළුතර | ... | 8,225 | |
| **මහනුවර කොට්ඨාශය** | | | | |
| මහනුවර පාසැල් වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට පාසැල් වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මහනුවර | ... | ,052 | |

| සේවය | ප්‍රදේශය | යැවිය හැකි ප්‍රමාණය | අවසාන දිනය |
|---|---|---|---|
| **මහනුවර කොට්ඨාශය** | | | |
| ගම්පළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට ගම්පළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ගම්පළ | ... 11,563 | |
| කඩුගන්නාව දුම්රියපොළේ සිට කඩුගන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ කඩුගන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට කඩුගන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කඩුගන්නාව | ... 12,000 | |
| රඹුක්කන දුම්රියපොළේ සිට ගලගෙදර සෞඛ්‍ය කාර්යාලයට සහ ගලගෙදර සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ගලගෙදර | ... 5,100 | |
| කටුගස්තොට දුම්රියපොළේ සිට හාරිස්පත්තුව සෞඛ්‍ය කාර්යාලයට සහ හාරිස්පත්තුව සෞඛ්‍ය කාර්යාලයේ සිට හාරිස්පත්තුව සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | හාරිස්පත්තුව | ... 15,035 | 2.8.60 |
| නාවලපිටිය දුම්රියපොළේ සිට නාවලපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයට සහ නාවලපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට නාවලපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | නාවලපිටිය | ... 3,007 | |
| මහනුවර කිරිපට්ටියේ කිරි මණ්ඩලයේ සිට තලාතුඔය සෞඛ්‍ය කාර්යාලයට සහ තලාතුඔය සෞඛ්‍ය කාර්යාලයේ සිට තලාතුඔය සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | තලාතුඔය | ... 5,177 | |
| වත්තේගම දුම්රියපොළේ සිට වත්තේගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ වත්තේගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට වත්තේගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | වත්තේගම | ... 24,025 | |
| **කුරුණෑගල කොට්ඨාශය** | | | |
| කුරුණෑගල දුම්රියපොළේ සිට කුරුණෑගල ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ කුරුණෑගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට කුරුණෑගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කුරුණෑගල | ... 5,270 | |
| මාහෝ දුම්රියපොළේ සිට මාහෝ සෞඛ්‍ය කාර්යාලයට සහ මාහෝ සෞඛ්‍ය කාර්යාලයේ සිට මාහෝ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මාහෝ | ... 8,091 | |
| පොල්ගහවෙල දුම්රියපොළේ සිට පොල්ගහවෙල සෞඛ්‍ය කාර්යාලයට සහ පොල්ගහවෙල සෞඛ්‍ය කාර්යාලයේ සිට පොල්ගහවෙල සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | පොල්ගහවෙල | ... 10,850 | |
| වාරියපොළ කෘෂිකාර්මික ස්ථානයේ සිට වාරියපොළ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | වාරියපොළ | ... 930 | |
| **කෑගල්ල කොට්ඨාශය** | | | |
| රඹුක්කන දුම්රියපොළේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට රඹුක්කන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කෑගල්ල | ... 1,891 | |
| උඩුගොඩ රජයේ ගොවිපළේ සිට කුරුණෑගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කෑගල්ල | ... 3,437 | |
| කඩුගන්නාව දුම්රියපොළේ සිට මාවනැල්ල සෞඛ්‍ය කාර්යාලයට සහ මාවනැල්ලේ සෞඛ්‍ය කාර්යාලයේ සිට මාවනැල්ල සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මාවනැල්ල | ... 8,970 | |
| පොල්ගහවෙල කිරි පට්ටියේ කිරි මණ්ඩලයේ සිට අඹන්පිටිය සෞඛ්‍ය කාර්යාලයට සහ අඹන්පිටිය සෞඛ්‍ය කාර්යාලයේ සිට අඹන්පිටිය සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | අඹන්පිටිය | ... 7,500 | |
| උඩුගොඩ රජයේ ගොවිපොළේ සිට අඹන්පිටිය සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | අඹන්පිටිය | ... 1,275 | 4.8.60 |
| අඹේපුස්ස දුම්රියපොළේ සිට වරකපොළ සෞඛ්‍ය කාර්යාලයට සහ වරකපොළ සෞඛ්‍ය කාර්යාලයේ සිට වරකපොළ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගෙ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | වරකපොළ | ... 4,495 | |
| අඹේපුස්ස රජයේ ගොවිපොළේ සිට වරකපොළ සෞඛ්‍ය කාර්යාලයට සහ වරකපොළ සෞඛ්‍ය කාර්යාලයේ සිට වරකපොළ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | වරකපොළ | ... 8,153 | |
| උඩුගොඩ රජයේ ගොවිපොළේ සිට යටියන්තොට සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | යටියන්තොට (රුවන්වැල්ල) | ... 1,000 ... | |
| **පුත්තලම් කොට්ඨාශය** | | | |
| පුත්තලම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට පුත්තලම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | පුත්තලම | ... 6,900 | |
| මාරවිල සෞඛ්‍ය කාර්යාලයේ සිට මාරවිල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මාරාවිල (නාත්තන්ඩිය) | ... 9,300 | |
| **වවුනියා කොට්ඨාශය** | | | |
| රජයේ ගොවිපළේ සිට වවුනියා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | වවුනියාව | ... 1,050 | |
| මාන්කුලම් දුම්රියපොළේ සිට මුලතිව් සෞඛ්‍ය කාර්යාලයට සහ මුලතිව් සෞඛ්‍ය කාර්යාලයේ සිට මුලතිව් සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මුලතිව් | ... 6,750 | |
| මන්නාරම් දුම්රියපොළේ සිට මන්නාරම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ මන්නාරම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට මන්නාරම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කාර්යාලයට | මන්නාරම | ... 9,720 | |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බඩුබාහිර ගෙනයාම

රත්නපුර දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවා අධිකාරි තුමා විසින් එම දිස්ත්‍රික්කයේ වෛද්‍ය ආයතනවලට දුම්රිය පොළවල සිට හා දුම්රියට බඩු බාරගන්නා ස්ථානවල සිට 1.10.60 සහ 30.9.62 කාලය අතරතුර බඩුබාහිර ආදිය ගෙන යැම සඳහා මෙයට යාකර තිබෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනවල පෙරවරු 10ය දක්වා ලාංකිකයින් ගෙන් හා වෙළඳ සමාගම්වලින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. මෙහි පහත දැක්වෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනවල පෙරවරු 10යට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම වසා එකෙණෙහිම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවනට එතැනට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් ද ඔවුන්ගේ ගාස්තු ප්‍රමාණයද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ට කිය වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට, ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරී මට අවශ්‍ය නම්, සෞඛ්‍ය අධිකාරි තුමාගෙන් හෝ ඔහුගේ නියෝජිතයා ගෙන් හෝ අවසර ලබාගෙන ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයක දෙවන පිටපත පරීක්ෂා කිරීමට හැකිය.

3. ටෙන්ඩර් පත්‍ර මේ කාර්යාලයෙන් හෝ කොළඹ, කළුතර, ගාල්ල, මාතර, බදුල්ල, මාතලේ, නුවර, කුරුණෑගල, කෑගල්ල, පුත්තලම, මඩකලපුව, අනුරාධපුර, වවුනියා සහ යාපනය යන ඕනෑම සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයකින් ලබාගත හැකි ෆෝර්මවල ලියා පිටපත් දෙකක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර අයදුම්කරුවන් ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම සඳහා පහත සඳහන් උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් මුදල කච්චේරියක තැන්පත් කර මුදල් කුවිතාන්සිය ටෙන්ඩර් පත්‍ර වසන දිනයට පෙර දින මධ්‍යාහනයේ 12ට පෙර ඉදිරි පත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර තැපැලෙන් ඉල්වන අය, කල්වේලා ඇතිව මුදල් කුවිතාන්සියක් සමග ඉල්ලුම් කළ යුතුය.

5. සියලුම ටෙන්ඩර් පත්‍ර රත්නපුරේ සෞඛ්‍ය සේවා අධිකාරි තුමාට ලැබෙන සේ එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ වම් පැත්තේ උඩ කෙළවරෙහි ටෙන්ඩර් පත්‍ර කුමන කරුණක් සඳහාද යන්න ලිවිය යුතුයි. කවරයෙහි ටෙන්ඩර්කරුවන්ගේ නම හා ලිපිනයද සඳහන් විය යුතුයි.

ටෙන්ඩර් පත්‍ර ඒ සඳහා මේ කාර්යාලයෙහි පිළියෙල කර තිබෙන ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ හැකිය. එසේ නැතහොත් මෙම කාර්යාලයෙහි ගණාධිකාරි තුමාට භාරදී රිසිට් පතක් ලබාගත හැක. රෙජිස්ටර් තැපැලෙන් ද එවිය හැක. තැපැලෙන් හෝ වෙන ක්‍රමයකින් හෝ ටෙන්ඩර් වසන දිනයේ පෙරවරු 10ට පසු ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

6. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් නොවන අය ටෙන්ඩර් පත්‍ර ඉල්ලීමට ප්‍රථම ඔවුන්ගේ වත්කම පහත සඳහන් මට හෝ ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරනු ලබන නිලධාරි තැනට ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා නියමිත ආකෘති පත්‍ර මේ කාර්යාලයෙන් හෝ මෙහි තුන්වන ඡේදයේ සඳහන් ඕනෑම කාර්යාලයකින් ලබාගත හැක. දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් ඒ බව ටෙන්ඩර් පත්‍ර ඉල්ලන විට දන්විය යුතුයි. එසේ නොවන අය ටෙන්ඩර් පත්‍ර ඉල්ලන විට තමන්ගේ වටිනාකම ප්‍රකාශ කළාද යන බවත් එසේ නම් කාටද යන බවත් දන්විය යුතුයි.

**සටහන.**—ටෙන්ඩර්කරුවන්ට ඔවුන්ගේ වටිනාකම කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අවවාද කරනු ලැබේ. මෙසේ ඉදිරිපත් කළ යුත්තේ ටෙන්ඩර් පත්‍ර සලකා බැලීමට පෙර ඔවුන්ගේ මුදල් තත්ත්වය ගැන රපෝර්තු ලබා ගැනීමට අවශ්‍ය නිසාය.

7. ටෙන්ඩර්කරුවන් පහත සඳහන් කොන්දේසි විශේෂයෙන් මතක තබා ගත යුතුයි :—

(අ) බඩුබාහිර ගෙනයාමේදී ප්‍රවාහන ගාස්තු ගෙවනු ලබන්නේ සැතපුම් 1/2කට හෝ ඊට වැඩිනම් සැතපුමකටද සැතපුම් 1/2 කට අඩුනම් නියම දුරටත් ය.

(ආ) ටොන් එකට වැඩි ප්‍රේෂනයට මුදල් ගෙවනු ලබන්නේ ඒ කොට්ඨාශයේ ආදායම් පාලක නිලධාරි තුමාගේ රෙකමදාරුව අනුවය.

(ඇ) පසුව විවෘත කරනු ලබන ආයතනවලට බඩු ගෙන යාමේදී ප්‍රවාහන ගාස්තු ගෙවනු ලබන්නේ ආදායම් පාලක නිලධාරි තුමාගේ ගාස්තු අනුවය.

8. ටෙන්ඩර් කොන්දේසි ටෙන්ඩර් පත්‍රයෙහි පසු පිටෙහි සඳහන්ව ඇත. එහි සඳහන් කොන්දේසි ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන විට ටෙන්ඩර්කරුවන්ගේ අවධානයට යොමු විය යුතුයි. කිසිම කරුණක් නොදක්වා ටෙන්ඩර් පත්‍ර එකක් හෝ සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ බලය දෙපාර්තමේන්තුව සතුය.

දොස්තර ඒ. කේ. ඇම්. පෙරේරා,
සෞඛ්‍ය සේවා අධිකාරි තැන.

සෞඛ්‍ය සේවා අධිකාරි තැනගේ කාර්යාලය,
රත්නපුරය, 25.6.60.

### පූර්වෝක්ත උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | (3) ආරක්ෂක තැන්පත් මුදල රු. ශ. | (4) ටෙන්ඩර් වැසීමේ දිනය හා වේලාව |
|---|---|---|---|
| බඩුබාහිරාදිය දුම්රිය පොළ වලින් හා දුම්රියට බඩු ගන්නා ස්ථාන වලින් වෛද්‍ය ආයතන වලට ගෙනයෑම එම ආයතන වලින් දුම්රියපොළට හෝ දුම්රියට බඩුබාර ගන්නා ස්ථාන වලට ගෙන ඒම ... | | | |
| රත්නපුර දිස්ත්‍රික්කය— | | | |
| පාදුක්ක, ඇහැලියගොඩ, කුරුවිට, රත්නපුරය කිරිවාන කැටිය ... ... | 100 00 ... | 300 00 ... | 22.7.60 පූ.භා. 10 |
| දැල, කහවත්ත සහ ඕපනායක | 100 00 ... | 400 00 ... | 22.7.60 පූ.භා. 10 |

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් තැනීම සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 ජූලි මස 27 වැනි බදාදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ.

(1) මල්දෙනියේ ආරෝග්‍යශාලාවට ජල සම්පාදන ක්‍රමයක් තැනීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 ජූලි 22 වැනි සිකුරාදා සවස 4 වන තෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 20,000 වඩා වටිනාකමැති ජල සම්පාදන කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවන්ට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් සියයට 5ක වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩ නැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාලයේ අංක 159 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපැලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපැලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මානුවල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

1960ක් වූ ජූනි මස 27 වෙනි දින,
ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 ජූලි මස 26 වැනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ.

(1) දෙල්තොට ආරෝග්‍යශාලාවේ ජල සම්පාදන ක්‍රමයේ ඉතිරි වැඩ නිම කිරීම—ම. ප.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 ජූලි 22 වැනි සිකුරාදා සවස 4 වන තෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 5,000 වඩා වටිනාකමැති ජල කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ට ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ ලංකා බැන්කුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. සැලසුම්, විස්තර විභාග, ශිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවන්ට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් සියයට 5ක වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡෙදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම් නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

1960ක් වූ ජූනි මස 27 වෙනි දින,
ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### මහනුවර, වටපුලුව නිවාස ක්‍රමය සඳහා ඇතුල් පාරවල් තැනීම

මහනුවර, වටපුලුව නිවාස ක්‍රමය සඳහා ඇතුල් පාරවල් තැනීම පිණිස ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 ජූලි මස 29 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරවල් තැනීමේ වැඩ සඳහා රුපියල් 80,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 80ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 ජූලි මස 27 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රේ. ලෝ. ආර්නෝල්ඩ,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1960 ජූනි මස 22 වෙනි දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කෑගල්ලේ 3 එම් වර්ගයේ ගෙවල් 6ක් සහ ජල සම්පාදන ක්‍රමයක් තැනීම

1960. 6. 3 දින දරණ ගැසට් පත්‍රයෙහි 1960. 6. 27 දනමින් පළවූ ඉහත සඳහන් දැන්වීම සම්බන්ධයෙන් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1960 ජූලි මස 29 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් දීර්ඝ කර ඇත.

1960 ජූලි මස 27 වෙනි බදාදා පස්වරු 3 වන තුරු මුදල් තැන්පත් කර ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක.

ආර්. ඇල්. ආර්නෝල්ඩ,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1960 ජූනි මස 24 වැනි දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544,
කොළඹ 2 දීය.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### බම්බලපිටිය තට්ටු නිවාස සඳහා සෙන්ට්‍රිපියුගල් පොම්ප දෙකක් සවිකිරීම

බම්බලපිටිය තට්ටුනිවාස සඳහා සෙන්ට්‍රිපියුගල් පොම්ප දෙකක් සවිකිරීම පිණිස ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 ජූලි මස 29 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර්පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 25ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 ජූලි මස 27 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ.

රේ. ලෝ. ආර්නෝල්ඩ,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2,
1960 ජූනි මස 27 වෙනි දින.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1960 ජූලි මස 22 වැනි දින පෙරවරු 10.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ:—

| පාසැලේ නම | කළ යුතු වැඩ |
|---|---|
| සී./වැල්ලවත්ත බෞද්ධ ගැහැණු පාසැල | පාසැල් ගොඩනැගිල්ල තැනීම |

සංලක්ෂ්‍යය : සී—කොළඹ දිස්ත්‍රික්කය.

2. රුපියල් 60,000 කට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි තැනීම සඳහා ලියාපදිංචිව සිටින්නන්ට හෝ, රුපියල් 1,20,000 කට හෝ ඊට වැඩි ගණනකට ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි ව සිටින්නන්ට හෝ රුපියල් 60,000 කට හෝ ඊට නො අඩු ගණනක ගොඩනැගිලි තැනීමේ කටයුතු භාර ගැනීමට පොහොසත් බවට සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් ගෙන් හෝ, ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගෙන් හෝ කම්කරු කොමසාරිස්වරයාගෙන් සහතිකයක් අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කරන අනුමත කළ සමුපකාර අමිතිවලට හෝ, ග්‍රාම සංවර්ධන සමිතිවලට හෝ කම්කරු සමුපකාර සමිතිවලට 1960 ජූලි මස 21 වැනි දින පස්වරු 3.30 තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ඇත.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, (එස්. ඩබ්ලිව්. ශාඛාවේ) අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත හැක. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ පූර්වෝක්ත 2 වැනි පරිච්ඡේදයෙහි සඳහන් මුදල් ප්‍රමාණයට ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

4. පූර්වෝක්ත 2 වැනි ඡෙදයෙහි සඳහන් ප්‍රකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (එස්. ඩබ්. ශාඛාව) ලබා ගත හැකි ආකෘති පත්‍රවල අනු පිටපතක් සහිතව ටෙන්ඩර් ඉල්ලුම් කළ යුතුයි. සියලුම විස්තර හා තොරතුරු එතුමාගෙන් ලබාගත හැකි වන අතර සැලැස්ම ද එම කාර්යාලයෙහි දී බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර

කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් නො එවතහොත්, වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ටෙන්ඩර් පත්‍ර බහාලන පිට කවරයේ ලියා, මුද්‍රා තැබූ ටෙන්ඩර් පත්‍ර තමා ම හෝ තමාගේ නියෝජිතයන් පෞද්ගලිකව අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යාල සහායකට භාර දී ඒ බවට ලියවිල්ලක් ඒ භාරදුන් වහාම ලබා ගත යුතු ය.

5. 1960 ජූලි මස 22 වැනි දින පෙරවරු 10.30ට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් ද, ගණන් ප්‍රමාණ ද ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දින සිට සති 6 ක් ස්වකීය ගණන් යෝජනාව විවෘත ව තැබිය යුතු ය.

7. වෙනත් අවශ්‍ය විස්තර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අධ්‍යක්ෂ (එස්. ඩබ්ලිව්. ශාඛාව) ගෙන් ලබා ගත හැකි වන අතර ටෙන්ඩර් ලියකියවිලි ද මෙහි දී පරීක්ෂා කර බැලිය හැක.

8. ටෙන්ඩර් කරනු ලැබූ වැඩයකිරීම සඳහා නුපුහුණු මෙන් ම පුහුණු ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට තෝරා ගත් ටෙන්ඩර්කරුට සිදුවෙනවා ඇත. එවැනි කම්කරුවන් හැකිතාක් දුරට තෝරා ගත යුත්තේ ඒ වැඩ කරනු ලබන ප්‍රදේශයෙනි. ලාංකික කම්කරුවන් පමණක් සහ ටෙන්ඩර් කරනු ලැබූ ප්‍රදේශයේ පදිංචි කම්කරුවන් පමණක් සේවයෙහි යෙදවීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් කරනු ඇත. ලාංකික නො වූ කම්කරුවන් හෝ ටෙන්ඩර් කරනු ලැබූ වැඩය කරනු ලබන ප්‍රදේශයේ පදිංචිකරුවන් නො වන ලාංකික කම්කරුවන් සේවයෙහි යෙදවීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා ගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා අවසර දී ඇති විශෙෂ අවස්ථාවන්හි දී හැර වෙන මොනම අවස්ථාවකවත් තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් මෙම කොන්දේසිය නො පිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කිරීමක් සේ සලකනු ලබන අතර, කොන්ත්‍රාත්තුව අවලංගු වීමටද යටත් වේ. එවැනි සම්මුතිය හා අනුමැතිය නො මැතිව ලාංකික නො වූ කම්කරුවන් හෝ ටෙන්ඩර් කරනු ලැබූ වැඩය කරනු ලබන ප්‍රදේශයේ පදිංචිකරුවන් නොවන කම්කරුවන් සේවයෙහි යෙදවීම තහනම් වේ.

ක්ලැරන්ස් ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

1960 ජූනි මස 24 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් දැන්වීම අවලංගු කිරීම

බිරි/හරස්ගල රජයේ පාසැල් ගොඩනැගිල්ලක්, ගුරු නිවාස යක් සහ වැසිකිළි සෑදීම සම්බන්ධයෙන් 1960.6.3 දින දරණ ගැසට් පත්‍රයේ 404 වැනි පිටේ සඳහන් දැන්වීම මෙයින් අවලංගු කරමි.

මේ වැඩය යථා කාලයේදී නැවත ගැසට් කරණු ලැබේ. එවිට, දැනට ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීම උදෙසා මුදල් තැන්පත් කර තිබෙන අයට ටෙන්ඩර් පත්‍ර දෙනු ලැබේ.

කේ. ඒ. ධර්මකීර්ති,
බණ්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කායභාලය,
බණ්ඩාරවෙල, 22.6.60.

---

## 1960-61 වර්ෂයෙහි කොළඹ දිස්ත්‍රික්කයේ ආහාර ද්‍රව්‍ය සහ "ඇදිහැස" පිටි ගෙනයාම

කොළඹ යූනියන් පෙදෙසේ අංක 330 දරණ ආහාර, වාණිජ සහ වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මීගමුව සහ ජාඇල දුම්රිය ස්ථානයේ සිට මීගමුව සහ ජාඇල සහල් ගබඩාවට ආහාර ද්‍රව්‍ය සහ ඇදිහැස පිටි ගෙනයෑම පිණිස ටෙන්ඩර් පත්‍ර 1960 ජූලි මස 26 වැනි දින පස්වරු 2.30 දක්වාද, කොළඹ නාගරික සභාව, මොරටුව, වත්තල, ගම්පහ, වේයන්ගොඩ අඹගහවත්ත සහ මීරිගම යන කොට්ඨාශවලට අයත් පාඨශාලාවලට "ඇදිහැස" පිටි ගෙනයෑම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 ජූලි 26 වැනි දින පෙරවරු 11 දක්වා (කොළඹ දිස්ත්‍රික්කයේ) කොළඹ කච්චේරියේ නියෝජ්‍ය ආහාර පාලක තැන විසින්ද භාරගනු ලැබේ.

2. කොළඹ කච්චේරියේ ආහාර පාලන තැනගේ කායභාලයෙන් පමණක් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉල්ලුම් කළ යුතුයි. එසේ ඉල්ලුම් කරන ටෙන්ඩර් පිටපත් 2 බැගින් ඉදිරිපත් කළ යුතුයි. 1960 ජූලි මස 22 වැනි දින පස්වරු 3 න් පසු ආකෘති පත්‍ර සපයනු නොලැබේ.

3. මීගමුව සහ ජාඇල සහල් ගබඩාවල් පිළිබඳ ආකෘති පත්‍ර ලබා ගැනීමට ප්‍රථමයෙන් රු. 250 ක මුදලක්ද, 1 වෙනි පරිච්ඡේදය එක් එක් පාඨශාලා කොට්ඨාශ පිළිබඳ ආකෘති පත්‍ර ලබා ගැනීමට රු. 50 ක මුදලක් ද කොළඹ කච්චේරියේ තැන්පත් කළයුතුයි.

4. වැඩිදුර විස්තර කොළඹ දිස්ත්‍රික්කයේ ආහාර පාලක තැනගේ කායභාලයෙන් ලබාගත හැක.

ඇස්. ඕ. සුගතදාස,
කොළඹ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය
ආහාර පාලක තැන වෙනුවට.

1960 ක්වූ ජූනි මස 24 වෙනි දින,
කොළඹ කච්චේරියේ දීය.

---

## 1960/61 වර්ෂය තුළ කළුතර දිස්ත්‍රික්කයේ ආහාර ද්‍රව්‍යයන් ගෙනයෑම හා පැටවීම බෑම් ආදිය

1960/61 ආදායම් වර්ෂය තුල කළුතර සහ අළුත්ගම රජයේ ආහාර ගබඩාවලට ආහාර ද්‍රව්‍යයන් ගෙනයෑම් පැටවීම් හා බෑම් ආදිය සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 ජූලි මස 25 වැනි දින පූර්ව භාග 11 දක්වා කළුතර නියොජ්‍ය ආහාරපාලක තුමා විසින් භාරගනු ලැබේ.

